**දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතිය සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල - 2017**

-----------------------------------------------------------------------------------------------------------------------

දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සහයෝගිතාව සඳහා වන ජපාන බැංකුව, වර්තමානයේ අන්තර්ජාතික සහයෝගිතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය අතර 2008 ජූලි 29 දින එළඹි අංක එස්එල්-පී 94 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 (3) වගන්තිය 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දිළිඳු ජනතාවගේ ආදායම් මට්ටම වැඩි දියුණු කිරීම හා ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීමෙන් ඔවුන් සඳහා විධිමත් මූල්‍ය සේවා පුළුල් කිරීම, සහභාගිත්ව මූල්‍ය ආයතන හා හවුල්කාර නියෝජිතායතනවල කළමනාකරණ හා පුහුණු ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ප්‍රතිලාභින්ගේ ආදායම් ඉපයීමේ අවස්ථා වැඩි කිරීම හා කුසලතා වර්ධනය කිරීම මගින් දිළිඳුකම පිටුදැකීමට සහායවීම, ප්‍රාදේශීය අසමානතා අවම කිරීම සහ සාමය ගොඩනැංවීමට උපකාරීවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 2,759 කට සමාන රු. මිලියන 3,076 ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 2,575 කට සමාන රු.මිලියන 2,704 ක් අන්තර්ජාතික සහයෝගිතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 ජනවාරි ආරම්භ කළ අතර 2013 දෙසැම්බර් අවසන් කිරීමට නියමිත විය. තවද, අවසන් ණය වියපැහැදම් කිරීම සඳහා ණය ක්‍රියාත්මක වීමේ දිනය 2015 නොවැම්බර් 12 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය පුකාශන පිළියෙල කර විගණන සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය ඇති කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල

ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයත් සහ ව්‍යාපෘතියේ සහ චක්‍රීය අරමුදලේ මෙහෙයුම් වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය සහ චක්‍රීය අරමුදල මඟින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ සහ චක්‍රීය අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘතියේ සහ චක්‍රීය අරමුදලේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ සහ චක්‍රීය අරමුදලේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ සහ චක්‍රීය අරමුදලේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ කරන ලද ආපසුගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ සහ චක්‍රීය අරමුදලේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය සහ සහ චක්‍රීය අරමුදල ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ සහ චක්‍රීය අරමුදලේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීවලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය තුලදී අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුලදී හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් (මිලියන) | රුපියල් (මිලියන) | රුපියල් (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රුපියල් (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රුපියල් (මිලියන) |
| ජ.අ.ස.නි. | 2,575 | 2,704.00 | - | - | - | 2,562 | 3,470.00 |
| ශ්‍රී.ලං.ර. | - | 372.00 | 47 | - | 40.50 | - | 292.90 |
| | 2,575 | 3,076.00 | 47 | - | 40.50 | 2,562 | 3,762.90 |

### 3.2 භෞතික ප්‍රගතිය

-----------------

එකතු කරගත් තොරතුරු අනුව, ව්‍යාපෘතිය මගින් සහභාගිත්ව මූල්‍යායතන 11 ක් හරහා ව්‍යාපෘතියේ කාල සීමාව අවසානයේදී රු. මිලියන 3,213 ක උප ණය 59,215 ක් නිදහස් කර තිබුණු අතර, මුළු උප ණය එකතු වටිනාකමින් සියයට 86 ක් නියෝජනය වන උප ණය 50,076 ක් රජය සතු සහභාගිත්ව මූල්‍යායතන 03 ක් හරහා ද මුළු උප ණය එකතු වටිනාකමින් සියයට 14 ක් නියෝජනය වන වෙනත් උප ණය 9,139 ක් පෞද්ගලික අංශයේ සහභාගිත්ව මූල්‍යායතන 08 ක් හරහා ද නිදහස් කර තිබුණි.

තවද, ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4(1) වගන්තිය අනුව, 2011 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ චක්‍රීය අරමුදල් ගිණුම විවෘත කර තිබුණු අතර චක්‍රීය අරමුදලේ මෙහෙයුම් කටයුතු 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුලදී, චක්‍රීය අරමුදල මගින් රු.මිලියන 1,033 ක් වටිනා උප ණය නිදහස් කර තිබුණි සහ 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 6,680 ක උප ණය නිදහස් කර තිබුණි.

## 3.3 හඳුනාගත් පාඩු

-----------------

2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3.11 ක හානිකරණ පාඩුවක් හඳුනාගෙන තිබෙන බව නිරීක්ෂණය වූ අතර ප්‍රතිවර්තන මිලදී ගැනීම් වල නියලී සිටින ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු විසින් මහ බැංකුව සමඟ ඇතිකරගෙන තිබෙන ගිවිසුම කඩකිරීම හේතුවෙන් 2018 ජනවාරි 01 දින කල්පිරුනු ප්‍රතිවර්ත මිලදී ගැනීම් ආයෝජනයන් සම්බන්ධයෙන් රු. මිලියන 37.7 ක ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර තිබුණි.